පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 125/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 24/01/2024 පැය 0740

# මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## නීති විරෝධී ගිනි අවි හා බෝම්බ අත්අඩංගුවට ගැනීමට තොරතුරු ලබා දෙන පුද්ගලයින්ට ත්‍යාග මුදල් පිරිනැමීම - පොලිස් මූලස්ථානය.

2023.12.17 වන දින සිට ක්‍රියාත්මක "යුක්තිය" මෙහෙයුම මඟින් සිදු කරනු ලබන සාර්ථක අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් එම සාර්ථක තොරතුරු ලබා දෙන ඔත්තුකරු ඇගයීම සඳහා ත්‍යාග මුදල් පිරිනැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදුකරන ලෙස වැඩබලන පොලිස්පති තුමා විසින් සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියොජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර නිලධාරින් සහ අධ්‍යක්ෂකවරුන් ඇතුළු නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

ඒ අනුව නීති විරෝධී ගිනි අවි හා බෝම්බ අත්අඩංගුවට ගැනීමේ දී එම වැටලීම සිදු කිරීමට එම තොරතුරු ලබා දෙන පුද්ගලයින්ගේ රහස්‍යභාවය ආරක්ෂා කරනු ලබන අතර, පහත පරිදි ත්‍යාග මුදල් ලබා දීමට තීරණය කර ඇත.

| ගිනි අවි හා බෝම්බ වර්ගය | සැකකරු සමඟ අවිය අත්අඩංගුවට ගැනීමේදී පුද්ගලික ඔත්තුකරුට | සැකකරු නොමැතිව අවිය අත්අඩංගුවට ගැනීමේදී පුද්ගලික ඔත්තුකරුට |
|---|---|---|
| ස්වයංක්‍රීය ගිනි අවි (T56, AK47, M16, SAR 80, T81 හා වෙනත්) | 250,000/- | 250,000/- |
| අර්ධ ස්වංයක්‍රීය අවි (පිස්තෝල අවි, 84 S, SLR, Auto Loading Shot Guns හා වෙනත් අර්ධ ස්වයංක්‍රීය අවි) | 250,000/- | 250,000/- |
| රිවෝල්වර් අවි | 150,000/- | 100,000/- |
| රිපීටර් තුවක්කු | 50,000/- | 25,000/- |
| පතරොම් තුවක්කු (විදේශන්හි නිෂ්පාදිත) | 15,000/- | 10,000/- |

| | | |
|---|---|---|
| විදේශයන්හි නිෂ්පාදිත අත්බෝම්බ | 25,000/- | 15,000/- |
| දේශීය නිෂ්පාදිත ගිනි අවි | 15,000/- | 10,000/- |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**